# 3 වන වාර පරීක්ෂණය - 2009

සිංහල භාෂාව හා සාහිත්‍යය | කාලය පැය 2 යි

නම:................................................................ ශ්‍රේණිය............... අංකය.................

**1 පත්‍රය**

1) මුලින් දී ඇති පදයට සමාන අර්ථය ඇති පදය ඉදිරියේ ඇති වරහන තුළින් තෝරා එය යටින් ඉරක් අඳින්න.
   I. සොම්නස - (සැනසීම, උතුම්, සතුට, දුක)
   II. චන්ද්‍රයා - (දිවයුරු, නිසයුරු, කසුන්,හිරු)

2) අක්ෂර වින්‍යාසය අනුව නිවැරදි පදය යටින් ඉරක් අඳින්න.
   I. ගුරුත්වාකර්ශනය, ගුරුත්වාකර්ෂණය, ගුරුත්වාකර්ශණය, ගුරුත්වාකර්සනය
   II. අධිෂ්ඨානය, අදිෂ්ඨානය, අධිශ්ටානය, අදිෂ්ටාණය

3) පහත සඳහන් යුගල පද වරහන තුල ඇති පද යොදා සම්පූර්ණ කරන්න.
   I. ගනු.................. III. සැප........................
   II. මුදල්.................. IV. සිරිත්........................

   (හදල්, සනීප, විරිත්, දෙනු )

පහත සඳහන් ජේදයේ හිස්තැන් වලට සුදුසු අක්ෂර වරහන් තුළ දීඇති අක්ෂර වලින් තෝරා සම්පූර්ණ කරන්න.

(ෂ, ඤ, භ, ස, ණ, බ, ඥ, ග, න, ඝ)

සඳ මත පා තැබීම අභ්‍යවකාශ 4) තර.......යේ ඉතා වැදගත් පියවරක් විය. සිකුරු, ප්ලූටෝ, බ්‍රහස්පති ආදී වෙනත් ග්‍රහලෝක කරාද 5) ගවේ.......ණ යානා යැවීමට 6) විද්‍යා.......යෝ සමත් වී සිටිති. එමෙන්ම දැන් 7).......ගනගාමීන් නොවන සාමාන්‍ය ජනතාවද අභ්‍යවකාශ චාරිකා 8) ආරම්....... කර ඇත.

සුදුසු පද යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න

9) .............................. සියලු දෙනාම රට ජාතිය රැක ගැනීමට කටයුතු කරමු.
10) ............................... සභාව ඉදිරියේ මිහිරි ගීයක් ගැයුවාය.
(ඇය, දේශපාලකයෝ, ඔහු, අපි)

11) පහත සඳහන් එක් එක් පේළියේ ඇති වචන වලින් මහප්‍රාණ අක්ෂරයක් යෙදී ඇති වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

   I. (i) අවධානය (ii) තෘප්තිමත් (iii) පුස්තකාලය (iv) ප්‍රබල
   II. (i) තොරතුරු (ii) සෞන්දර්යය (iii) අභාවය (iv) චිත්‍රය

පහත සඳහන් ප්‍රස්ථාව පිරුළු වරහන තුළ ඇති වචන යොදා ගනිමින් සම්පූර්ණ කරන්න.

12) අනුනගේ පානෙන් ............................ බලනවා වගෙයි.
13) තමන් හිසට තම .......................... සෙවණැල්ලයි.
(ලස්සන, අතමය, එළිය, වතමය)

සුදුසු විරාම ලක්ෂණ යොදන්න.

14) ඔහු එඩිතරය ක්‍රියාශීලීය දක්ෂය අවංකය
15) අහා මෙතරම් සුන්දර පරිසරයක් යැයි ඇය කීවාය

16) මුලින් දී ඇති පදයට විරුද්ධ පදය වරහන තුළින් තෝරා ලියන්න.
I. ජ්‍යෙෂ්ඨ = ........................
II. අවසානය = ........................
(නිශ්චිත, කනිෂ්ඨ, රාත්‍රිය, ආරම්භය)

සුදුසු ආඛ්‍යාත පදය වරහන් තුළින් තෝරා ලියන්න.
17) ගැමියෝ තම සුන්දර වූත් කටුක වූත් අත්දැකීම් කවි මගින් ඉදිරිපත් ............................
(කළහ, කරයි, කරන්නේය, කරන්නීය)
18) දූ දරුවෝ තෙරුවන් වැඳ අනතුරුව දෙගුරුන් .............................
(පුදයි, පිදූහ, පුදන්නේය, පුදමි)

මෙම වාක්‍ය වලට ගැලපෙන තනි පදය ලියන්න.
19) ජලයෙහි උපන් = ....................................
20) රාත්‍රි කාලයෙහි හැසිරෙන = ....................................
(නිශාචර, අකලංක, ජලජ, ජලනිධි)

## II පත්‍රය

❖ පළමුවන හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1) පාසල් පාදක ඇගයීම් වලදී සිංහල විෂය සඳහා ඔබ විසින් සාමුහිකව නිර්මාණය කළ පොත් පිංච ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
I. (අ) ඔබ නිම කළ පොත් පිංච සඳහා යෙදූ නම කුමක්ද?
(ආ) ඔබ කණ්ඩායම සකස් කළ පොත් පිංචෙහි පටුන ලියා දක්වන්න.
II. පොත් පිංච නිර්මාණයේදී එක් එක් කණ්ඩායම් වලට පැවරුණු කාර්යභාරය පිළිබඳව කෙටි විස්තරයක ලියන්න.
III. මෙබඳු නිර්මාණයක් කිරීම තුළින් ඔබට ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.
IV. පොත් පිංච නිර්මාණය සඳහා ඔබ කණ්ඩායම තොරතුරු ලබාගත් අයුරු පැහැදිලි කරන්න.
V. ඔබ කණ්ඩායම සකස් කළ නිර්මාණය පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.
VI. මෙම පොත් පිංච නිර්මාණය කිරීමේදී ඔබ යොදා ගනු ලැබූ ප්‍රස්ථාව පිරුළක් ලියා දක්වන්න.
VII. පොත් පිංච සැකසීමේදී මතුවූ ගැටලු මොනවාද?

2) පහත සඳහන් මාතෘකා වලින් එකක් තෝරාගෙන වචන 150කට නොඅඩු රචනාවක් ලියන්න.

I. පොසොන් දා අපේ මල් දන්සල
II. මා වෛද්‍යවරයකු වුවහොත්
III. කුරුලු රජදහනක් මැද දී
IV. උගත මනා ශිල්පය මයි මතු රැකෙනා
V. මගේ රට මට අගනේය

3) වේයන්ගොඩ බණ්ඩාරනායක විදුහලේ බෞද්ධ සංගමයේ ලේඛම් ඔබ යැයි සිතා ඔබ විදුහලේ ඇති පොත් අලෙවිසැලේ වෙසක් මස අලෙවි කිරීම සඳහා වෙසක් සුබ පැතුම් පත් ගෙන්වා ගැනීමට ගුණසිරි ප්‍රකාශකයෝ, කුලරත්න මාවත, කොළඹ යන ලිපිනයට ලිපියක් ලියන්න.

4) පහත සඳහන් කවිය සම්පූර්ණ කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ඉන්නේ දුම්බරයි මහ කළු ගලක් යට
කන්නේ කරවලයි රට හාලේ බතට
......................................................................
......................................................................

i. ඉහත පද්‍ය සම්පූර්ණ කරන්න.
II. මෙම කවිය කුමන වර්ගයකට අයත් ජන කවියක්ද?
III. මෙම කවියෙන් කුමන වෘත්තියක් (රැකියාවක්) ගැන කියවේද?
IV. මෙම වෘත්තියෙහි නියැලෙන පුද්ගලයින් ආහාර ලෙස ගන්නේ මොනවාද?

5) පහත සඳහන් එක් එක් පාඨය ඇතුළත් පාඩම නම් කර, එම පාඨය ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් දැයි සඳහන් කරන්න.

i. “ගුණයා, වර මුනා හරි හොයා ගන්ට රුකුලෙ රිංගන්ට”
II. “අලියෙක් ඉන්නවා. කවුරුත් නිශ්ශබ්ද වෙන්න”
III. “නෑ තාත්තේ, අපි වැඩ කරමු. මං තාත්තාට උදව් වෙන්නම්”
IV. “මගේ විශ්වවිද්‍යාලය මහජන පුස්තකාලය”
V. “වළලු බලන්න නෙවේ මං ආවේ, ඔය සිංදුව ඇහිලයි”

6) පහත සඳහන් පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

එ දවස උදාස න
මහසත් තුමා සසොබ න
පබවත ගෙනෙන මෙ න
යමැයි සාගල පුරට සිතමි න

තෙද විකුම් පළ කොට
මෙමා සිත ඉඟි සිදු කොට
එනතෙක් මෙ නුවරට
මෙ රජ සිරිසර හැම නියම කොට

මපිය රජ හට වත්
සොහොවුරු කුමරිඳුට වත්
මෙ රජ සිරි දුන හොත්
ගැනුම් උගනට වේය නැවතත්

i. මෙහි සඳහන් නගරයේ නම කුමක්ද?
II. තෙද විකුම්, රජ සිරිසර යන පද වල තේරුම් ලියන්න.
III. මෙහි ස්ත්‍රියකගේ නමක් සඳහන් වේ. එම නම කුමක්ද?
IV. මෙම පද්‍ය පන්තියට වඩාත් සුදුසු මාතෘකාවක් යොදන්න.

7) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ඉන්දියානු සංස්කෘත මහාකාව්‍ය ග්‍රන්ථයක් වූ රාමායණයෙහිද රිටිගල ගැන සඳහන් වෙයි. එහි සඳහන් අන්දමට ලංකාවේ රාවණා රජු සමඟ යුද වැදුණු ඉන්දියාවේ රාම රජුගේ සොහොයුරු ලක්ෂ්මන් කුමාරයාට යුද්ධයේදී තුවාල සිදු විය. එවිට ඉන්දියාවේ හිමාල වනයට ගොස් ඖෂධ පැළෑටි රැගෙන එන ලෙස හනුමන් නම් වානරයාට නියම කරන ලදී. හනුමන්ට එහි යන අතරතුර, ඖෂධ පැළෑටි වල නම් අමතක වූයෙන් ඔහු හිමාලයේ ඖෂධ උයනෙන් කොටසක්ම උදුරා ගෙන ලංකාවට ගෙනැවිත් රිටිගල කන්දට අත හැරියේලු. අදත් රිටිගල කන්ද ඖෂධ පැළෑටි වලින් ගහන ස්ථානයක් වේ. රිටිගල වනපෙතට නායකයකු වූ යක්ෂ ගෝත්‍රික ජයසේන මහසෝනා බවට පත් වී ඇත්තේද මේ ස්ථානයේදී බව ජනප්‍රවාද වල සඳහන් වේ.

i. මෙහි සඳහන් ආකාරයට රාමායණය යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?
II. මෙම ඡේදයේ සඳහන් පරිදි ඖෂධ පැළෑටි රැගෙන ආවේ කොහි සිටද? කවුරුන් විසින්ද?
III. ජනප්‍රවාද වල සඳහන් වනුයේ කුමක්ද?
IV. රාම රජුගේ සෙහොයුරාගේ නම සඳහන් කරන්න.
V. “ඖෂධ” යන පදයට සමාන තේරුම් දෙන තවත් පදයක් ලියන්න.